THE WORLD BANK

Working for a World Free of Poverty

**NEWS RELEASE**
**South Asia Region**

| | |
|---|---|
| **News Release** No. SAR | **Media Contacts:**<br>*In Colombo*: Chulie De Silva<br>*e-mail:* cdesilva@worldbank.org<br>Tel. (94-11) 5561-323<br>*In Washington*: Erik Nora<br>enora@worldbank.org<br>Tel: (202) 458-4735 |

<u>2008 වසර සඳහා ලෝක බැංකුව සිවිල් සමාජ අරමුදලට ඉල්ලුම් පත්‍ර කැඳවයි'</u>

2008 ජනවාරි මස 11 වෙනි දින කොළඹ'

ලෝක බැංකුවේ කොළඹ කාර්යාලය 2008 සිවිල් සමාජ අරමුදලට හෙවත් විධිමත් ලෙස හඳුන්වන ලබන සුළු ආධාර වැඩසටහන සඳහා ඉල්ලුම්පත්‍ර එවන මෙන් ශ්‍රී ලංකාවේ සියලුම සිවිල් සමාජ සංවිධාන වලට ආරාධනා කෙරේ'

¶සංවර්ධනය සඳහා ගැටුම් නිරාකරණය¦ සිවිල් සමාජ අරමුදලේ 2008 වසර සඳහා තේමාව වේ' ප්‍රායෝගික ලෙස ගැටුම් නිරාකරණය අරමුණු කරගත් හා ස්ථිරසාර සාමය ගෙන ඒම සඳහා අවශ්‍ය සහජීවනය වඩවන සම්බන්ධතා යලි ප්‍රතිස්ථාපනය කරවීමට සමත් වැඩ පිළිවෙලවල් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ' වර්ෂ 2008 දී ඇ' ඩො' 5000 (රු 500 000) පමණ වූ ආධාර කොටස් 07 ක් මෙහිදී පිරිනැමේ' එමෙන්ම අයදුම්කරුවන් වසරක් තුලදී තමන් නිම කල යුතු වැඩ ප්‍රමාණයන් නිමකිරීමට කැමත්ත දැක්විය යුතුය'

ගැටුම්කාරී බව ශ්‍රී ලංකාවේ සංවර්ධනය අඩාල කර ඇත. එය ශ්‍රී ලංකාව අති විශාල ලෙස දියුණු කළ හැකි බව අවබෝධ කර ගැනීමේ දී බාධකයක් වශයෙන් ද කටයුතු කර ඇත' මෙම අරමුදල සොයන්නේ සාකච්ඡා සහ ඵලදායී සම්බන්ධතාවයන් ගොඩනගන අවකාශයන් සහ ස්ථිරසාර සාමයෙන් පිරිපුන් ජීවන පරිසරයක් ලබාගැනීමේ මාවතට ජනවර්ග යොමුකරණ ක්‍රියාදාමයන්ය'

ගැටුම්කාරී සහ ගැටුම් සම්බන්ධ ක්ෂේත්‍රයන්හි කැපකිරීමකින් කටයුතු කර ඇති සියළුම ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ආයතන මේ සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබයි' මේ ආයතන ශක්තිමත් ඒවා වියයුතු අතර ජනවර්ගික අ∏බුදය සම්බන්ධ ප්‍රශ්ණ වලදී සම්මානනීය සේවාවන් ඉටුකර ඇති බවට හා අවංක ලෙස මුල්‍ය කටයුතු ඉටුකර ඇති බවට සහතික කළ හැකි වාර්තා ඇති සංවිධාන විය යුතුය' මෙම වැඩසටහනෙහිදී එක් සංවිධානයකට ඉදිරිපත් කල හැක්කේ එක් අයදුම්පතක් පමණි'

සිවිල් සමාජ අරමුදල සඳහා අයදුම්පත් හා ඉංග්‍රීසි" සිංහල හා දෙමළ මාධ්‍යයෙන් නිකුත් කර ඇති යෝජනා ලිවීම පිළිබඳ කෙටි පාඨමාලාවක් අඩංගු කුඩා පොතක් ද ලෝක බැංකුවේ කොළඹ ශාඛාවල නො 73" ගාලු පාර" කොළඹ 03 ස්ථානයේ හා www.worldbank.lk වෙබ් අඩවියෙන් ලබාගත හැක' තැපැල් හෝ විද්‍යුත් තැපෑල මගින් අයදුම්පත්‍ර ලබාගැනීමට සඳහා කරුණාකර කරීමා තිලකසේන මිය ඉහත ලිපිනය kthilakasena@worldbank.org, Tel :- 5561318, හෝ දිලිනිකා පිරිස් dpeiris@worldbank.org, Tel :- 5561325 අමතන්න.

සිවිල් සමාජ සංවිධාන පිළිබඳ වැඩි විස්තර ලබාගැනීම සඳහා www.worldbank.lk වෙබ් අඩවියට පිවිසිය යුතු අතර ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේ අවසාන දිනය 2008'02'18 වෙනි දින බව කරුණාවෙන් සලකන්න'

**<u>සිවිල් සමාජ සංවිධාන සඳහා උපදෙස්</u>**

❖ **වැඩසටහන පිළිබඳව**

ලෝක බැංකුවේ ශ්‍රී ලංකා කාර්යාලය මගින් පාලනය වන සුළු ආධාර සැපයීමෙන් සිවිල් සමාජ අරමුදල ජනතා සහභාගීත්වය සම්බන්ධ වැඩසටහන් වලට සහය දෙයි' සංවර්ධන ක්‍රියාදාමයන් වල ප්‍රතිඵල සඳහා බලපෑම් කිරීමට සහ වැඩි දියුණු කිරීමට ශ්‍රී ලාංකික රටවැසියන් බලාත්මක සහ ශක්තිමත් අය බවට පත්කරන උපකාරී ක්‍රියාදාමයන් ශ්‍රී ලංකා සිවිල් සමාජ අරමුදල විසින් ආරම්භ කර ක්‍රියාත්මක කරනු ලැබේ'

**කොටුව 01 - ප්‍රජා සහභාගීත්වයේ ප්‍රතිඵල**

**ප්‍රජා සහභාගීත්වය.............**

- දේශීය හිමිකාරිත්වය පිළිබඳ පොදු එකඟත්වයකට පැමිනීමට පෙළඹවීමෙන් දැනුම බෙදාහැරීමේ ජාලයක් නිර්මාණය කිරීම මගින්, එකිනෙකා අතර අවබෝධය ඇති කිරීම මගින්, මහජනයා හා පෞද්ගලික අංශය අතර සහයෝගීතාවයට දිරිදීම මගින් හා ඇතැම් විට ඇතිවන අවිනිශ්චිභාවයන් ව්‍යර්ථ කිරීම මගින් ජාතික දරිද්‍රතාවය අඩුකිරීම සහ සංවර්ධන ක්‍රමවේද ද ඉහළ දැමීමට හැකිවනු ඇත'

- ප්‍රාථමික හා ද්විතීයික සාමාජිකයන්ගේ දුක්ගැනවිලි වලට හඬක්දීමෙන් විශේෂයෙන්ම දුප්පත් හා අර්ධ දුප්පත් කොටස් වල හඬට කන්දීමෙන් ඔවුන්ගේ අදහස් ප්‍රතිපත්තිමය හා වැඩසටහන් තීරණ වලට අන්තර්ගත කල හැකිය'

- විශේෂයෙන්ම ප්‍රජාතල වලදී ප්‍රදේශය පිළිබඳ දැනුම ලබාදීමෙන්, ඇතිවිය හැකි අවදානම් හඳුනාගැනීමෙන්, උදවු ලබාගැනීමෙන්, මාවත් විවෘත කිරීමෙන් සංවර්ධන වැඩසටහන් වලදී ලැබෙන වාසිය ශක්තිමත් හා වර්ධනය කල හැක'

- සංවර්ධන අභියෝග වලට විසඳුම් හා නිර්මාණාත්මක අදහස් ගෝලීය හා දේශීය මට්ටම් වලින් ගෙන ඒම'

- සංවර්ධන ක්‍රියාකරකම් වල පොදුජන විනිවිදභාවය හා වගකීම් සහිත බව වර්ධනය කිරීම' යහපත් පාලනයක් සඳහා අවශ්‍ය පරිසරය සැකසීම'

## <u>ඔබ අයදුම් කිරීමට පෙර</u>

සිවිල් සමාජ සංවිධාන අරමුදල මගින් ආධාර ලැබෙනුයේ ලැබෙන ඉල්ලුම් අතරින් ඉතා සුළු ප්‍රතිශතයකට පමණි' බොහෝ ඉල්ලුම් ප්‍රතික්ෂේප වන්නේ එය ලැබීමට නුසුදුසු නිසා නොව එම ඉල්ලීම් වත්මන් ඉලක්ක සමඟ හෝ සිවිල් අරමුදලේ නිර්ණායක සමඟ තෝරාගත් අනිකුත්

යෝජනා මෙන් නොගැලපෙන නිසාවෙනි' ඔබේ ක්‍රියාකාරකම නිර්ණායක හා අරමුණු ගණයට අඩංගු විය හැක' නමුත් ඉල්ලුම අරමුදල් ඇති ප්‍රමාණයට වඩා බෙහෙවින් වැඩිය' ඉල්ලුම් කිරීමට පෙර කරුණාකර උපදෙස් කියවා ඔබගේ ඉල්ලුම්පත ගැලපේ දැයි සලකා බලන්න'

## අයදුම් කළ හැක්කේ කාටද ႇ

- සංවර්ධනය අරමුණු කොටගත් ලාංකීය සිවිල් සංවිධාන වලට අධාර සඳහා අයදුම් කළ හැක'
- සිවිල් සමාජ සංවිධාන වලට ස්ථාවර බවක් හා සමාජ සේවා ඉලක්ක කරගත් සම්මානනීය වාර්තාවන් සහ මූල්‍ය ක්ෂේත්‍රයේ යහපත් වාර්තාවන් ද තිබිය යුතුයි'
- මෙම වැඩසටහන මගින් පසුගිය වර්ෂ වලදී සහය නොලැබූ සංවිධාන වලට මූලිකත්වය දෙනු ලැබේ. (වසර පහක කාලයක් තුළදී තෙවරකට වඩා සිවිල් සමාජ අරමුදලින් අධාර ලැබීමට සංවිධාන වලට අවස්ථාව නොලැබේ)'

## කුමන ආකාරයේ ක්‍රියාකාරකම් වලට සහයෝගය ලැබේද ?

සිවිල් සමාජ අරමුදල" ප්‍රජා සහභාගීත්වය ප්‍රාථමික අරමුණු කරගත් ක්‍රියාකාරකම් වලට සහය දෙයි' ඊට අමතරව

- ක්‍රියාකාරකම් අඩංගු විය හැකි නමුත් දැනුම හා ප්‍රජා සහභාගීත්වය අරමුණු කරගත් වැඩමුළු හා සම්මන්ත්‍රණ වලට පමණක් එය සීමා නොවිය යුතුය' ප්‍රතිපත්ති සකස් කිරීමට හෝ පොදු සේවා සැපයීමට බලපාන සුදුසු සන්නිවේදන ව්‍යාපාර හෝ අදාල අංශයේ විශේෂිත වූ හැකියාවන් වර්ධනය කිරීමට හැකි ක්‍රියාකාරී නවතම සාමූහික ක්‍රියාකරකමක් විය යුතුය'
- ක්‍රියාකාරකම ආධාර සැපයූ පළමු දින සිට වසරක කාලයක් තුළ සම්පූර්ණ කළ යුතුය'
- පෙර වසර වලදී ආධාර නොලත් සංවිධාන වලට මූලිකත්වය දෙනු ලැබේ'

## කුමන වර්ගයේ ක්‍රියාකාරකම් සඳහා සහයෝගය නොලැබේ ද ?

සිවිල් සමාජ අරමුදලින් ආධාර නොදිය හැක්කේ පර්යේෂණ වැඩසටහන්" විධිමත් අධ්‍යාපනික පුහුණු වැඩසටහන්" මෙහෙයුම් ව්‍යාපෘති" මූලික සේවා සැපයීම්" ක්‍රියාත්මක වන ආයතන වල හරවත් සහයෝගීතා (උපකරණ වැනි) ශිෂ්‍යත්ව" සාමාජිකත්වය" අධ්‍යයන වැඩසටහන්" තමා තමන් වෙනුවෙන්ම ඉල්ලුම් කරන පුද්ගලයින් හෝ නීති විරෝධී ආයතන සඳහා යෝජිත ක්‍රියාකාරකම්" ලෝක බැංකුවේ නිත්‍ය මෙවලම් වල ආදේශන හෝ ඒ සමග තරගකාරී නොවිය යුතුය' ක්‍රියාකාරකම පැහැදිලි ලෙසම ලෝක බැංකුවේ නිත්‍ය වැඩසටහන් වලින් වෙනස්ව හඳුනාගත හැකි විය යුතුය'

ඉහත සඳහන් කළ වර්ග වලට අනුව සාමාන්‍යයෙන් නුසුදුසු වන ක්‍රියාකාරකම් හා අයිතමයන් වලට උදාහරණ පහත දැක්වේ'

- ඍජු සේවා සැපයීම
- වෛද්‍ය උපකරණ" රෝහල් උපකරණ" ශ්‍රවණ ආධාරක" කිහිලිකරු සැපයීම
- පරිගණක උපාංග සහ සවිකිරීම්

- පොදු කාර්ය වියදම් (ගෙවල් කුලී" පවත්වාගැනීමේ වියදම්" පොදු කාර්යාල අවශ්‍යතාවයන්)
- ක්‍රියාකාරකමට අදාල දක්ෂතා දියුණු කිරීමේ වැඩමුළු" සේවා වියුක්තිය" ඒඩ්ස් රෝගය පිළිබඳ දැනුම" නැතිනම්
- වෙනත් ප්‍රාථමික සිවිල් නිරත වීමේ අරමුණු සිවිල් සංගම් සංවිධානයේ හැකියාව දියුණු කිරීම මගින් ඒවා බැංකු ව්‍යාපාර වල උපදේශක සහ සේවකයන් හැටියට කටයුතු කිරීමට සැලස්වීම
- මූලික අවශ්‍යතාවයන් වන වතුර" උෂ්ණත්වය හා කෑම සැපයීම
- පුස්තකාල සහ සනිපාරක්ෂක  කටයුතු වලට අවශ්‍ය තැනීම් කිරීම
- රැකියා ඇතිකිරීම
- රෝග නිවාරණ වැඩසටහන්
- ආහාර ආධාර
- පූර්ණ කාලීන වැටුප් (උදාහරණයක් ලෙස රාජ්‍ය නොවන සංවිධානයේ අධ්‍යක්ෂකගේ වැටුප්)
- ජල යෝජනා ක්‍රම සහ ළිං වැනි යටිතල පහසුකම්

## <u>ආධාර සඳහා තෝරාගැනීමේ නිර්ණායක</u>

පහත සඳහන් දෑ මූලික තේරීමේ නිර්ණායක වේ'

- **ඵලදායීතාවය #** යෝජනාව ප්‍රජා සහභාගීත්වයේ අරමුණු අමතයිද? විශේෂයෙන් සංවර්ධන ප්‍රතිඵල වලට බලපෑම් කිරීමට හා ඒවා දියුණු කිරීම සඳහා සහභාගීත්වය අඩංගු වීම" වගකීම වැනි ක්‍රියාවලින් ශක්තිමත් කිරීම තකා පොදු අංශය සමඟ එකතුව කටයුතු කරණ පුද්ගලයින් හෝ සංවිධිත කණ්ඩායම් වලට ක්‍රියාකාරකමින් සහයෝගයක් ලැබේද ?
- **ශක්‍යතාවය #** යෝජිත පිවිසුම ප්‍රායෝගික ද ? කාලසීමාව හා අයවැය ප්‍රමාණවත් ද ?
- **සංවිධානයේ ධාරිතාවය #** සංවිධානයේ කාර්යය මණ්ඩලය හා අධ්‍යක්ෂ මණ්ඩලය ව්‍යාපෘතියට ගෙන එන දක්ෂතා මොනවාද ? ඒවා ව්‍යාපෘතියේ අරමුණු වලට අදාල ද ? දැන් සංවිධානය යෝජනා කරන යෝජනා වලට සමාන ප්‍රයත්න වලදී සංවිධානය සාර්ථක වී ඇත් ද ?
- **සංවිධානයේ විශ්වාසනීය බව #** කුමන වර්ගයේ ගෞරවනීය බවක් සංවිධානය තම සමාජයේදී හා ඉන් ඔබ්බට ලබයි ද ?
- **වැදගත්කම #** ව්‍යාපෘතිය අර්ථවත්ද ? සමාජයට අවශ්‍ය ක්‍රියා හා කාර්යයන් යෝජනාව ඉටු කරන බවට සාක්ෂි තිබේද ? එය අරමුණු කරගත් එය අමතන ගැටළුව විසඳීමට හෝ ආධාර කිරීමට ජනවර්ගයේ වෙනසක් ඇති කරයි ද ? ඔබට ආධාර කිරීම සඳහා වෙනත් අවස්ථා ද ලබාදී මෙම වකවානුවෙහි ආධාර කිරීමට උචිත ද ?
- **තුලනය #** ලෝක බැංකුවේ ශ්‍රී ලාංකික කාර්යාලය මෙම ක්‍රියාකාරකම් වල ආයෝජන පාරාසය භූගෝලීය ප්‍රමිති මගින් තුලනය කිරීමට තොරාගත හැක'

### <u>කොපමන ප්‍රමාණයේ ආධාර සැපයේ ද ?</u>

බොහෝමයක් ආධාර ඇ' ඩො' 3000 සිට ඇ' ඩො' 5000 දක්වා පරාසයට අයත් වේ' සිවිල් සමාජ අරමුදල කලාතුරකින් යෝජිත අයවැයෙන් භාගයකට වඩා කිසියම් ක්‍රියාකාරකමකට ආධාර සපයයි' එම නිසා අනෙකුත් සම්පත් වලින් ද අතිරේක දායකත්ව තම ආධාර මගින් එකතු කිරීමට

කැමැත්තක් දක්වයි' ලෝක බැංකුවේ ආධාර අනෙකුත් ගැලපෙන අරමුදල් දායකයින්ගෙන් ලබා ගැනීමට ඉවහල් වන අයුරු විස්තර කරන ලෙසට අයදුම් කරන සංවිධාන වලට දැනුම් දී ඇත'

**<u>ආධාර සඳහා ඉල්ලුම් කරන්නේ කෙසේ ද ?</u>**

ලෝක බැංකු ශ්‍රී ලංකා කාර්යාලය සිවිල් සංවිධාන අරමුදල පාලනය කරන අතර අයදුම්පත් කැඳවීම සහ තීරණ ගැනීම අවුරුද්දකට වරක් පමණක් සිදු කෙරේ' සිවිල් සංවිධාන අරමුදල් කොමිටිය ආධාර ප්‍රදානය කරන අතර ශ්‍රී ලංකා ලෝක බැංකු කාර්යාලය මගින් එය දැනුම් දීම කෙරේ' තෝරාගැනීමේ ක්‍රමවේදයන්ට අනුව කටයුතු කර ඇත්දැයි සලකා බැලීමට ඉල්ලුම්පත්‍ර පරික්ෂාවට භාජනය කෙරේ' සියළුම යෝජනා සඳහා සිවිල් සමාජ අරමුදල සම්පූර්ණ සැලකිල්ල යොමු කරන අතර සමාලෝචන කටයුතු මාස හතරක කාලයක් පුරා කෙරෙනු ඇත' උපදෙස්" ඉල්ලුම්පත්‍ර සහ කෙටිකාලීන යෝජනා ලිවීම සම්බන්ධ කෙටිකාලීන වැඩසටහන" සිංහල" දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් අංක 73/05" ගාලු පාර" කොළඹ 03" පිළිගැනීමේ අංශය" කොළඹ කාර්යාලය" ලෝක බැංකුව සහ ලෝක බැංකුවෙහි වෙබ් ජාලය වන www.worldbank.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය'

ඔබට ඉල්ලුම්පත්‍ර තැපැල් මගින් සහ විද්‍යුත් තැපෑල මගින් ලබාගැනීමට අවශ්‍ය නම් කරුණාකර කරීමා තිලකසේන මිය ඉහත සඳහන් වූ ලිපිනයෙන් හෝ kthilakasena@worldbank.org හෝ දුරකථන අංකය 5561318 හෝ dpeiris@worldbank.org ලබාගත හැක' ඉල්ලුම්පත්‍ර ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීමට පෙර ක්‍රමවේදය හා ඉල්ලුම්පත්‍ර පරික්ෂාවෙන් කියවන ලෙස අයදුම්කරුවන්ට දැනුම් දෙනු ලැබේ.

ආධාර ලැබුම්කරුවන් දුරකථන පණිවිඩ දීමෙන් හෝ ආධාර ඉල්ලුම්පත්‍ර සම්බන්ධයෙන් ලෝක බැංකු කොළඹ කාර්යාලයට පුද්ගලිකව පැමිණීමෙන් වලකින ලෙස කාරණාවෙන් දැනුම් දෙනු ලැබේ.

ලෝක බැංකු වෙබ් අඩවිය www.worldbank.lk සිවිල් සමාජ සංවිධාන සඳහා අමතර විස්තර සපයනු ඇත.